# කොටපොල ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය
---------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොටපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීමේදී ප්‍රාදේශීය සභාවේ සභිකයින් සඳහා ණය පදනම මත ලබාදී ඇති යතුරු පැදි සඳහා වාරික මුදල් ලෙස රු.517,950 ක මුදලක් ආපසු අයකර ගෙන තිබූ අතර එම මුදල ආදායම් ආධාර යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සභාව සතු ප්‍රජා ශාලා 05 ක වටිනාකම් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාවේ ජල ව්‍යාපෘතිය සඳහා මිළදී ගෙන තිබූ රු.61,475 ක ජල උපකරණ ප්‍රාග්ධන වැය ලෙස ගිණුම්ගත නොකර පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී සභාවේ පුස්තකාල 02 සඳහා මිළදී ගෙන තිබුණු හා පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු පොත්වල වටිනාකම රු.323,669 ක් වුවද රු.313,389 ක මුදලක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණෙන් රු.10,280 ක මුදලකින් වත්කම් අඩුවෙන් ගිණුම්ගතව තිබුණි.

(ඉ) පුස්තකාල පොත් මිළදී ගැනීමේදී ලද රු.55,727 ක වට්ටම් මුදල ප්‍රාග්ධන වැය ශීර්ෂයට හර කර ආදායම් ශීර්ෂයට බැර කර නොතිබුණද පුස්තකාල පොත් ගිණුම හර කර තිබුණි.

(ඊ) වීථි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් සභාවට ලැබිය යුතු රු.202,059 ක මුදල ණය ගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත වියයුතු රු.222,350 ක් වූ වියදම් ලී බඩු හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබූ අතර ඉවත් කරන ලද දොරවල්වල වටිනාකම පොත්වලින් ඉවත්කර නොතිබුණි.

1.3.2 අවිනිශ්චිත ගිණුම්
-------------------

සමාලෝචිත වර්ෂය අවසානයේ ශේෂ පත්‍රයේ දැක්වෙන රු.1,460,873 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙනවිත් තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.29,959,394 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.23,463,829 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.32,925,550 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ සමීක්ෂණ මණ්ඩල වාර්තා, රු.211,819 ක් වටිනා ස්ථාවර තැන්පතු සම්බන්ධ තැන්පතු සහතික හා තැන්පතු ලේඛනය මෙන්ම රු.346,834 ක් වටිනා එකතු කල අගය මත බදු වෙනුවෙන් බදු ලේඛනය හා රු.93,060 ක් වන කුලී පාලන ගිණුම සඳහා උපලේඛනයද විගණනයට ඉදිරිපත් නොවීය.

1.3.5 නීති, රීති ,හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 218 | සභාව ප්‍රයෝජනයට ගනු ලබන හා පදිංචියට ගනු ලබන සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | පරිසනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,439,133 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,596,838 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,063 | 1,310 | 264 |
| කුලී | 6,797 | 5,593 | 1,.539 |
| වෙනත් ආදායම් | 10,701 | 10,630 | - |

2.2.2 වරිපනම් බදු

2014 වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කිරීම් රු.1,063,000 ක් වූ අතර එකී මුදලින් වර්ෂය තුල ලැබීම් රු.1,310,124 ක් විය. 2014 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.264,234 ක් වූ අතර අයවූ මුදල රු.72,004 කි. ඒ අනුව හිඟ මුදල අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 27 ක් විය.

2.2.3 බදුකුලී

සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ බදු කුලී වටිනාකම රු.1,477,723 ක් වූ අතර එම හිඟ මුදලින් 2014 වර්ෂයේ අයවී තිබුණේ රු.132,832 ක් විය. ඒ අනුව අයවීමේ ප්‍රතිශතය සියයට 9 ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ රු.6,939,223 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 760,589 |
| මුද්දර ගාස්තු | 6,178,634 |

2.2.5 ජල ගාස්තු

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක ජල ව්‍යාපෘතිය මගින් ජල පහසුකම් සැපයූ ජල පාරිභෝගිකයන් 1089 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.625,307 ක මුදලක්ද 2014 වර්ෂයේදී ජල සැපයුම විසන්ධි කරන ලද ජල පාරිභෝගිකයින්ගෙන් රු.161,662 ක මුදලක්ද අයවීමට තිබුණි. එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 විනෝද බදු
------------------

දෙනියාය තුසිත සිනමා ශාලාවෙන් 1995 වර්ෂයේ මැයි මාසයේ සිට 2005 ජුලි මාසය දක්වා වූ වර්ෂ 10 ක කාල පරිච්ඡේදය තුල සභාවට අයවීමට තිබූ රු.419,132 ක විනෝද බදු වටිනාකම අයකර ගැනීමට නඩු පවරා තිබුණද සභාවේ නියෝජිතයන් නඩු වාර සඳහා පෙනී නොසිටී බැවින් මෙම නඩුව අධිකරණය විසින් නිෂ්ප්‍රභා කර තිබූ අතර හිඟ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

3.1.1 වීථි පහන් නඩත්තු ආධාර ප්‍රතිපූර්ණය
-----------------------------------------

ප්‍රාදේශීය සභාව වීථි පහන් නඩත්තු සඳහා 2009 සිට 2014 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් රු.202,059 ක මුදලක් ලංකා විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි.

මේ සම්බන්ධව 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 හා 2010/17 දරන විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 1.2 ඡේදය කෙරෙහි සභාව අවධානය යොමුකර නොතිබුණි.

3.1.2 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 01 | 01 | - | - |
| තෘතියික | 01 | 02 | - | 01 |
| ද්විතියික | 19 | 15 | 04 | - |
| ප්‍රාථමික | 41 | 51 | - | 10 |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 15 | - | 15 |
| | 62 | 84 | 04 | 26 |

(i) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.16,086,730 ක් මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වියදම රු.18,276,739 ක් වූයෙන් සභා අරමුදලට රු.2,190,009 ක අතිරේක වැය බරක් වී තිබුණි.

(ii) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති අංක 17 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට අනියම්/ආදේශක කොන්ත්‍රාත් හෝ වෙනත් කිසියම් පදනමක් මත සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා තිබියදී, එකී චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් අනියම් හා ආදේශක සේවකයින් 15 දෙනෙකු බඳවා ගෙන රු.1,426,702 ක මුදලක් සභා අරමුදලින් වැටුප් වශයෙන් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් හා වියදම් සම්බන්ධව සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වන බැවින් අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන
---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ආදායම් පරිපාලනය
(ඊ) ගබඩා පරිපාලනය
(උ) මානව සම්පත් කළමනාකරණය